## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2018

-------------------------------------------

### තත්ත්වාගණනය කළ මතය

---------------------------------

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.4 සහ 1.5ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

### 1.4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1**<br>ප්‍රමිතයේ 32 වගන්තිය අනුව, අස්ථිත්වයක් විසින් ප්‍රමිතයක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙක හිලව් නොකළයුතුය. එහෙත් උපලේඛනය අනුව රු.97,602,473 ක් වූ ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂයෙන් ගිණුම්කරණ දෝෂ නිසා පැන නැගි රු.5,565,112 ක් වූ හර ශේෂ හිලව් කර ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂය රු.92,037,361 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නියෝජිත කොමිස් මුදල් ගිණුම පාලන ගිණුමක් වන බැවින් එහි ශුද්ධ වටිනාකම් පමණක් ලෙජරයේ පෙන්නුම් කරනු ලැබේ. එහෙත් විස්තරාත්මක උපලේඛනයක් සපයා ඇති අතර එහි හර ශේෂ හා බැර ශේෂ වටිනාකම් වෙන්වෙන්ව දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2**<br>ප්‍රමිතයේ 9 වගන්තිය අනුව තොග ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්විය යුතු වුවද සංස්ථාව විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව, පිරිවැයට රු.206,739,963 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම තොගයෙන් භෞතිකව සත්‍යාපනය කරන ලද රු.9,929,561 ක් වූ ශේෂය තුළ 2018 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි රු.254,763 ක ටෝනර් වර්ග තොග ශේෂයක්ද චලනය නොවන රු.434,177 ක සංයුක්ත තැටි, ටෝනර් යනාදී තොග ශේෂයක්ද ඇතුළත් විය . | තොගයේ ඇතුළත් භාවිතයට ගත නොහැකි හා චලනය නොවන තොග වටිනාකම් ඉදිරියේදී සිදු කරනු ලබන අපහරණ කටයුතු වලදී තොග වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| **(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**<br>ප්‍රමිතයේ 79 (බී) වගන්තිය අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ පිරියත හා උපකරණවල දළ ධාරන අගය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වුවත් අදාළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන යෙහි අංක 3.3 දේපළ පිරියත හා උපකරණ යටතේ සටහනකින් අනාවරණය කර ඇති අතර අදාළ වටිනාකම් සහිත සටහනක් අංක 08 යටතේ 26 වන පිටුවෙහි ඇතුළත් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**<br>සංස්ථාවට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් රු.754,000,000 ක වන්දි මුදල් ඉල්ලා අධිකරණයේ නඩු 9 ක් පවරා තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | 3.11 අසම්භාව්‍ය බැරකම් සටහන යටතේ පිටු අංක 12 හි මේ සමබන්ධයෙන් අදාළ කරුණු හෙළිදරව් කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38**<br>ප්‍රමිතයේ 118 (සී) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂයේ ආරම්භක දිනට හා අවසාන දිනට පවතින අස්පෘශ්‍ය වත්කම්වල දළ ධාරණ අගය හා සමුච්චිත ක්‍රමක්ෂය හෙළිදරව් කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය වෙනුවට ශුද්ධ අගය දක්වා තිබූ අතර, සමුච්චිත ක්‍රමක්ෂය වටිනාකමද දක්වා නොතිබුණි. | අස්පෘෂ්‍ය වත්කම්වලට අදාළ පිරිවැය, සමුච්චිත ක්‍රමක්ෂය සහිත සටහන අවසාන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ උපලේඛන සහිත වාර්තාවෙහි ඇතුළත් කර ඇත. ඉදිරි වර්ෂයේ සිට එය මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39**<br>ප්‍රමිතය අනුව ආයෝජන සාධාරණ අගයට (Fair value) මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයේ කර ඇති ආයෝජනයෙහි අගය පිරිවැයට එනම් රු.1,104,000 ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ආයෝජන අගය අඩුවීම හෝ වැඩිවීම හඳුනාගෙන අදාළ ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. තවද දැනට මෙවැනි ආයතනයක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(උ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS)**<br>ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 13 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කළ එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය | පිළිතුරු සපයා නොමැත. | ප්‍රමිතවල දැක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |

මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් ගත්මිල රු.3,161,875,819 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරන දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවා සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

### 1.4.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ නොවැම්බර් මාසයේදී සංස්ථාවට රු.100,000,000 ක් වූ මූල්‍ය ප්‍රදාන ලැබී තිබුණු නමුත් එම ප්‍රදාන සමාලෝචිත වර්ෂයේදී ක්‍රමක්ෂය කර නොතිබූ අතර 2016 වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ලද රු.11,500,000 ක් වූ වාහන එම ප්‍රදාන ලැබුණු දිනයේ සිට ක්‍රමක්ෂය කර තිබුණි. සංස්ථාවේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන දිනය ගිණුම්කරණ ප්‍රතිපත්තිය මගින් අනාවරණය කර නොතිබූ බැවින් ක්‍රමක්ෂය කිරීමේ නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකිව ඇත. | මෙහි දක්වා ඇති වටිනාකම වන රුපියල් මිලියන 100 ක ප්‍රදානයට අදාළ වත්කම් මිළදී ගැනීමේ කර්යය සම්පූර්ණ වූයේ 2019 වර්ෂයේදීය. එබැවින් මෙම වටිනාකම ක්‍රමක්‍ෂය කිරීම , අදාළ වත්කම් ලැබුණු පසු වත්කම් ක්‍ෂය කිරීමට සමගාමීව සිදු කරනු ලැබේ.<br><br>2016 වර්ෂයේ ලද ප්‍රදානය රුපියල් 11,500,000/- වටිනාකම වූ වාහන 02ක් වන අතර එය ලද දින සිට ක්‍ෂය කිරීම් සිදු කළ බැවින් ඊට සමගාමී ක්‍රමක්‍ෂයද සිදු කරන ලදී. | ක්‍රමක්ෂය පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීම. එම ප්‍රතිපත්තියට අනුකූලව පමණක් ක්‍රමක්ෂය සිදු කිරීම. |

### 1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)කොටස් 50කින් යුත් **"සොබාධාරා"** ගවේෂණාත්මක කාලීන පාරිසරික වැඩසටහන් මාලාව නිෂ්පාදනය කර විකාශය කිරීම සඳහා සංස්ථාව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ 2017 දෙසැම්බර් 29 දින එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව එහි 50 වන වැඩසටහන 2018 දෙසැම්බර් 28 වන දින විකාශය කර නිම වී තිබුණද අවසාන වැඩසටහන් 10 සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු. 5,000,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සොබාධාරා වැඩසටහනට අදාළ අවසාන ඉන්වොයිසිය 2018 දෙසැම්බර් 28 දින පිළියෙල කර ඇති අතර එය 2019 ජනවාරි මුල් සතියේදී නිකුත් කර ඇත. එම ඉන්වොයිස් වටිනාකම 2019 ජනවාරි මාසයේදීම ලැබී ඇති අතර එය පෙර වර්ෂයට අදාළ ගැලපීම් යටතේ ගිණුම් ගත කර ඇත. | අයවිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) **"පිවිතුරු පියස"** නමින් වූ වැඩසටහන් 10කින් යුත් අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ වැඩසටහන් මාලාවක් නිෂ්පාදනය කර විකාශය කරවීම සඳහා 2018 මාර්තු 01 සිට 2018 අගොස්තු 31 දක්වා මාස 06ක කාලයක් සඳහා වලංගු වූ ගිවිසුමක් සංස්ථාව හා කොළඹ මහ නගර සභාව අත්සන් කර තිබූ අතර ගිවිසුම ප්‍රකාරව වැඩසටහනකට රු. 366,432 බැගින් වැඩසටහන් 10 සඳහා ලැබිය යුතු රු. 3,664,320 ක මුදල වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එහෙත් අදාළ මුදල ගිවිසුම අත්සන් කරන දින හෝ දින 7ක් තුළ සංස්ථාවට ලැබිය යුතු වුවත් ගිවිසුම් ගත කාලය තුළ දී එම මුදල සංස්ථාවට ලබා ගැනීම හෝ ඒ අනුව සංස්ථාව විසින් අදාළ කාර්යය ඉටු කිරීම සිදු වී නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ හරහා ආදායම් ජනනයවීමක් ද සිදු වී නොතිබුණ බැවින් වෙනත් ආදායම් හා ලැබිය යුතු ආදායම් රු.3,664,320 ක් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | "පිවිතුරු පියස" වැඩසටහන් මාලාව නිෂ්පාදනය කිරීම සඳහා කොළඹ නගර සභාව සමග ගිවිසුම් ගත වීමෙන් පසුව අදාල වටිනාකම ලැබීයයුතු ආදායමක් ලෙස ගිණුම ගත කර ඇත.ගිවිසුමට අනුව දින 07ක් ඇතුලත සංස්ථාවට මුදල් ගෙවිය යුතු බව සඳහන් වුවද එම ආයතනයේ පවතින අභ්‍යන්තර ගැටළුවක් හේතුවෙන් මෙම වැඩසටහන් මාලාව නිෂ්පාදනය කිරීම ඇනහිට ඇත.එසේ වුවද ඒ පිළිබඳ නිල දැනුම් දීමක්ද මේ වන තෙක් කර නොමැති අතර එය ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගත වී තිබේ. | අදාළ ගිවිසුම 2018 අගෝස්තු 31 දිනෙන් අවලංගු වී ඇති බැවින් එම මුදල ලැබිය යුතු මුදලක් ලෙස දැක්විය නොහැකි අතර ආදායම්වලින් ඉවත් කළ යුතු වේ. |

### 1.4.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සමුච්චිත ක්ෂය | 3,508,843,034 | 3,521,799,983 | 12,956,949 | පිළිතුරු සපයා නොමැත. | වෙනසට හේතු පරීක්ෂාකර ගැලපීම් කළ යුතුය. |

### 1.4.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ ශුද්ධ වත්කම් 2014 වර්ෂයේ සිට 2017 දක්වා අඛණ්ඩවම අඩු වී තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබුණද 2018 වර්ෂය තුළදී ලද රු.479,000,000 ක් වූ රජයේ ප්‍රදාන හේතුවෙන් 2018 වර්ෂයයේදී රු.188,800,669 ක ලාභදායී තත්ත්වයක් වාර්තා කර තිබුණි. එසේම 2014 වර්ෂය අවසාන වන විට රු,135,658 ක් වූ බැංකු අයිරාව 2018 දෙසැම්බර් 31 දිනට රු.244,300,445 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් ඇති බව නිරීක්ෂණය කෙරේ. | පිළිතුරු සපයා නොමැත. | යහපත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක කළ යුතුයි. |

### 1.4.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ගෙවිය යුතු නියෝජිත කොමිස් | 92,037,360 | වයස් විශ්ලේෂණය | ගෙවියයුතු නියෝජිත කොමිස් මුදල් සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට පවතින පරිගණක පද්ධතිය මගින් ප්‍රතිපාදන නොමැත. එහෙත් මෙම පරිගණක පද්ධතියට අදාළ නවීකරණයන් සිදු කරීම තුළින් මේ සඳහා වයස් විශ්ලේෂණයක්ද ලබාගැනීමට නුදුරේදීම කටයුතු කරනු ලැබේ. | අදාළ සාක්ෂි සැපයිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) අයකර ගත නොහැකි ණයගැති ශේෂය | 58,459,978 | අයකරගත නොහැකි ණයගැතියන් හඳුනාගැනීමට සාධාරණ කරුණු | හානිකර වෙන්කිරීම ගණනය කිරීමේදී සම්පූර්ණයෙන් අයකර ගත නොහැකි ණයගැතියන් හඳුනා ගැනීමට ණයගැති වයස් විශ්ලේෂණය භාවිතා කර ඇත. ඒ අනුව අවුරුදු 05ට වැඩි දිගින් දිගටම අය නොවී පවතින ශේෂ සඳහා සියයට 100 ක හානි කරන වෙන් කිරීමක් සිදු කර ඇත. | ණයගැතියන් අයකරගත නොහැකි ලෙස හඳුනාගැනීමට පැහැදිලි හේතු දැක්විය යුතුය. |
| (ඇ) ලංකා පුවත් ආයතනයේ ආයෝජන | 1,104,000 | කොටස් සහතිකය | පිළිතුරු සපයා නොමැත. | කොටස් සහතිකය ලබා ගත යුතුය. |

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.5.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ ණයදීමේ ප්‍රතිපත්තියට අනුව ණයදීමේ කාල සීමාව මාස 01 ට සීමා වුවද එම ණය කාල සීමාව ඉක්ම වූ ණයගැති ශේෂය රු. 415,334,848 ක් හෙවත් සියයට 78 ක් වූ අතර ඉන් වසර 5ක් ද ඉක්ම වූ ණයගැති ශේෂය රු.72,377,998 ක් හෙවත් මුළු ණයගැතියන්ගෙන් සියයට 14 ක් වී තිබුණි. | සංස්ථාවේ ණය දීමේ ප්‍රතිපත්තියට අනුව ණය දීමේ කාලය මාසයකට සීමා වුවද ප්‍රායෝගිකව එසේ නියමිත මාසය තුළම ණය ගෙවීම් සිදු නොවන අවස්ථා ඇත. උදා: ක්‍රිකට් තරගාවලියක් හෝ එවැනි දිර්ඝකාලීන වැඩසටහන් මාසය ඉක්මවා විකාශය වන අවස්ථා ඇත. එවැනි අවස්ථා වලදී සම්පූර්ණ විකාශය අවසන් වූ පසු ඉන්වොයිස් කරනු ලබන අතර ගෙවීම් කරනු ලබනුයේ එයිනුත් පසුවය. එමෙන්ම මාසයකට අඩු කාලයක් තුළ විකාශය වුවද නියමිත දැන්වීම ප්‍රමාණය විකාශය නොවන අවස්ථා වල මුදල් ගෙවීම ප්‍රමාද වේ. | ණයගැතියන්ගෙන් අප්‍රමාදව මුදල් අයකර ගැනීම. ප්‍රමාද කාලය මත දණ්ඩන පොලිය පැනවීම. අප්‍රමාදව නෛතික ක්‍රියාමාර්ගවලට යොමුවීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට දැක්වෙන මුළු ණයගැති වටිනාකමින් රු.258,549,697 ක් හෙවත් සියයට 48 ක් රු. මිලියන 5ට වැඩි වටිනාකමින් යුත් ණයගැතියන් 12 දෙනෙකු සමඟ එළඹි ගිවිසුම් 21 ක් නියෝජනය වී තිබුණි. ඒ අතරින් 2014 වර්ෂයේ එළඹි ගිවිසුමකට අදාළව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලැබිය යුතු රු 10,000,000ක් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබුව ද ජාතික ඉතිරි කිරීමේ බැංකුව ගිවිසුමට නිසි පරිදි අත්සන් නොයෙදීම හේතුවෙන් අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| (ඇ) ගනුදෙනුකරුවන් සමඟ ප්‍රමාණවත් පරිදි විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීම, ගනුදෙනුකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන් සොයාගත නොහැකිවීම යනාදී හේතුමත ශේෂය රු.2,129,262 ක් වූ ණයගැතියන් 4 දෙනෙකු වෙනුවෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයාමට නොහැකි වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයවිය යුතු රු.534,003,529 ක් වූ ණයගැති ශේෂයෙන් වසර 5 ක් ඉක්ම වූ ණයගැති ශේෂය රු.72,377,998 ක් වූ අතර ඉන් රු.17,281,155 ක් හෙවත් සියයට 24 ක් පමණක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. එකතු වටිනාකම රු.33,134,937 ක් වූ ණයගැති ශේෂ පියවාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව පසුගිය වර්ෂයේදීද දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිඳු ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය තුළදීද අත්කරගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) 2018 දෙසැම්බර් 31 දිනට රු.534,003,529 ක් වූ සේවාදායක ණයගැති ශේෂය තුළ ආයතනය වසා දමා ඇති හෝ අය කර ගැනීමට ප්‍රමාණවත් වටිනාකම් නොමැති නිසා හෝ කාලාවරෝධ වී ඇති බැවින් හෝ වැඩිපුර උපලේඛනගතවීම් යනාදී කරුණු මත කපා හැරීම සඳහා නිර්දේශ කළ හා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලැබුණ රු.21,461,907 ක් අන්තර්ගතව තිබුණි. එම ශේෂය කපාහාරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් 2016 අගෝස්තු 24 දින ඉල්ලා තිබුණ නමුත් ඒ පිළිබඳ පසු විපරමක් මේ වන තුරුත් සිදු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) 1969 අංක 68 දරන කාලාවරෝධ පනතේ 11 වන වගන්තිය අනුව ණය නොගෙවනු ලබන සේවාදායකයන්ගෙන් ණය අයකරගැනීම සඳහා වර්ෂ 06 ක කාලයක් තුළ නඩු පැවරිය යුතු අතර එලෙස නඩු පැවරීමට නොහැකි වුවහොත් එම ගනුදෙනුව කාලාවරෝධ වේ. 2018 දෙසැම්බර් 31 දින වන විට එලෙස වර්ෂ 06 ක කාලය ඉකුත් වී ඇති ණයගැතියන් 70 දෙනෙකුගෙන් වටිනාකම රු.45,305,890 ක් වූ ණය ගනුදෙනු කාලාවරෝධ වීමට ප්‍රථම අය කර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (උ) 2018 දෙසැම්බර් 31 දිනට රු.534,003,529 ක් වූ සේවාදායක ණයගැති ශේෂයන්ගෙන් රු.3,118,264 ක් හෙවත් සියයට 6 ක වටිනාකමක් සඳහා පමණක් ආයතනය විසින් ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබුණි. | 2018 දෙසැම්බර් 31 වන දිනට සේවාදායක ණයගැති ශේෂ සනාථ කර ගැනීම පිණිස අදාළ සියලුම සේවාදායක ණයගැතියන්ට ලිපි යැවීමට කටයුතු කර ඇත. | සියලුම ණයගැතියන්ගෙන් ශේෂ සනාථන කැඳවිය යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.19,004,079ක් වූ සේවාදායක ණයහිමි ශේෂය තුළ 2014 සහ 2015 වර්ෂයන්හිදී කරන ලද ප්‍රතිවෙළඳ ගනුදෙනුවලට අදාළව රු.3,520,954 ක් වූ ණයහිමි ශේෂයක් ද ඇතුළත්ව තිබුණි. මෙම ගනුදෙනුවලට අදාළව සේවාදායකයන් සමග ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා මෙම මුදල් පිළිබඳව හිමිකම් පෑමට සේවාදායකයන්ට නොහැකි බැවින් මෙම මුදල් ආදායමට ගැනීම පිළිබඳව සලකා බලා නොතිබුණි. | සේවාදායක ණයහිමි ශේෂවල පවතින ශේෂයන් ආදායමට බැර කර ගැනීමට සලකා බලනු ලබන්නේ එම ශේෂයන් වර්ෂ 06 ක් ඉක්මවීමෙන් පසුවය. එබැවින් මෙහි සඳහන් ප්‍රති වෙළඳ ගිවිසුම් වලට අදාළ රු.3,520,954ක් වූ වටිනාකම වර්ෂ 06 ඉක්මවීමෙන් පසුව ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය අයකරගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකොට විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම (රු). | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය** | | | |
| • එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැඩ සටහන්, නවාතැන් පහසුකම්, සැපයීම් සහ මිලදී ගැනීම් වැනි කටයුතු සඳහා අවස්ථා 85 කදී උපරිම සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | 18,533,375 | මුදල් රෙගුලාසි අනුව අත්තිකාරම් සඳහා එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම අගය රු 100,000/- වුවද මෙම සංස්ථාවේ කාර්යය ස්වභාවය අනුව එම වටිනාකම ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| • අතුරු අග්‍රිම ලබා දිය හැක්කේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ට පමණක් වුවත් අවස්ථා 76 කදී මාණ්ඩලික නොවන නිලධාරින්ට අත්තිකාරම් ලබා දී තිබුණි. | 16,648,185 | වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේදී අදාල වැඩසටහන් සඳහා විශාල මුදලක් වැය වන බැවින් එක් එක් වැඩසටහන් සඳහා අදාල නිෂ්පාදක වරුන්ට ඉහත වටිනාකම ඉක්මවා අත්තිකාරම් ගෙවීමට සිදු වේ. | |
| • දෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද 2018 සැප්තැම්බර් මාසය තුලදී අවස්ථා 114 කදී නිකුත් කරන ලද රු.3,629,920 ක් වූ අත්තිකාරම් පියවීම දින 03 සිට දින 260 දක්වා ප්‍රමාද වී තිබුණු අතර 2015 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළදී නිකුත් කර තිබුණු අත්තිකාරම් මුදල් 2019 මැයි 20 දින වන විටද පියවා නොතිබුණි. | 2,018,247 | •අතුරු අග්‍රිම ලබා දිය හැක්කේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් වුවත් මෙම සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදකවරුන් මාණ්ඩලික ශ්‍රේණියට අයත් නිලධාරීන් නොවේ. එහෙත් නිෂ්පාදකවරුන් වැඩසටහන් නිෂ්පාදනයේදී අදාළ අත්තිකාරම් මුදල් ලබා ගත යුතු බැවින් ඔවුන්ට මෙම අත්තිකාරම් මුදල් ගෙවා ඇත. | |
| **(ii)** **මුදල් රෙගුලාසි 396** ගෙවීමට තිබෙන සෑම චෙක්පතකම වලංගු කාලය අවසාන වූ විට ඒ සම්බන්ධයෙන් අවලංගු කළ චෙක්පතේ මුදල, ගෙවන්නට ඇති ණයක් වශයෙන් ඒ ඒ ලෙජර්වල සටහන් කළ යුතු වුවත් එසේ කටයුතු නොකර අවලංගු කළ චෙක්පත් බැරකමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. 2013, 2014, 2015, 2016 2017 සහ 2018 වර්ෂයන්හිදී එලෙස අවලංගු කරන ලද චෙක්පත් වටිනාකම පිළිවෙලින් රු. 3,878,848, රු.86,535 , රු.4,992,832, රු.453,843 රු.10,298,794 ක් සහ රු.11,478,290 ක් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි. | 31,189,142 | සංස්ථාවේ අවලංගු චෙක්පත් වාර්ෂිකව සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වේ. ඒවා එක් එක් අයගේ නමින් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කිරීම ප්‍රායෝගිකව අපහසුවේ. එබැවින් එම චෙක්පත් වල වටිනාකම් එකතුවක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා ඇත. අදාළ විස්තර ලේඛන අවසාන ගිණුම් වලට අදාළව ලබාදෙන උප ලේඛන වාර්තාවේ දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 6.1 වගන්තිය**<br>වගන්තිය ප්‍රකාරව පැයකට ගෙවිය යුතු සාමාන්‍ය අතිකාල ගෙවීම් ප්‍රමාණය දිනක වැටුපෙන් 1/8 ක් හා දිනක වැටුප මාසික ඒකාබද්ධ වැටුපෙන් 1/30 ක් විය යුතු හා ජීවන වියදම් දීමනාව සැලකිය යුතු නොවූවද, සංස්ථා සේවකයන් සඳහා මූලික වැටුපට ජීවන වියදම් දීමනාව ආහාර දීමනාව සහ ගැලපුම් දීමනාව එකතු කිරීමෙන් පසු ලැබෙන අගය මාසික ඒකාබද්ධ වැටුප ලෙස සලකා ඉන් 1/20 ක් ලෙස අතිකාල ගණනය කර ගෙවා තිබුණි. ඒ අනුව 2018 මැයි මාසය තුළ සේවයේ යෙදීම වෙනුවෙන් සේවකයින් 11 දෙනෙකු සඳහා අතිකාල දීමනා වැඩිපුර ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | 515,613 | පිළිතුරු සපයා නොමැත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය**<br>අදාළ තනතුර පුරප්පාඩු වී හෝ තනතුර දරන්නා සේවයට නොපැමිණි අවස්ථාවක වැඩ බැලීම වෙනුවෙන් උපරිම මාස 03 ක කාලයක් සඳහා වැඩ බැලීමේ තනතුරක් ප්‍රදානය කළ හැකි වුවත් සංස්ථාව තුළ මාස තුන ඉක්මවා ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ බැලීමේ අවස්ථා 09 ක් පැවතුණි. මෙම සියලුම නිලධාරින් වසර 05 කට වැඩි කාලයක් තනතුරුවල වැඩ බැලීම් සිදුකර තිබුණි. | | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | | | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද මෙම වාර්තාවේ දිනය දක්වාම එය ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| **(ii) 2003 ජනවාරි 01 දිනැති අංක පීඊඩී 04 දරන චක්‍රලේඛය**<br>**2011 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 58 දරන චක්‍රලේඛය**<br>**2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන චක්‍රලේඛය**<br>මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයාට 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගෙවිය යුතු සියල්ල ඇතුළත් මාසික දීමනාව රු.30,000 ක් ලෙසද 2011 මැයි 01 දින සිට 2015 ජුනි දක්වා රු.60,000 ක් සහ 2015 ජුනි සිට රු.80,000 ක් ලෙසද, නියම කර තිබුණි. නමුත් මෙම විධිවිධානයන් නොසලකා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 759.07.00(i) දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් සංස්ථාවේ සභාපතිවරයාට 2010 ඔක්තෝබර් 01 දින සිට ඉහත දීමනාවට අමතරව රු.30,000 ක අතිරේක සංග්‍රහ දීමනාවක් අනුමත කර තිබුණු අතර එම චක්‍රලේඛ විරෝධී දීමනාව එදින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වාම මාසිකව ගෙවා තිබුණි. | 2,908,069 | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| **(iii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන චක්‍රලේඛය** | | | |
| • **<u>2.3 ඡේදය</u>**<br>ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති එම්එම් හා ජේඑම් තත්ත්වයේ නිලධාරීන් 137 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවීම. | 10,208,104 | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| • <u>**3.2 ඡේදය**</u><br>2018 වර්ෂයේ සංස්ථාවේ සේවයේ නිරතව සිටි සභාපතිවරුන් 03 දෙනෙකු සහ අධ්‍යක්ෂ ජනරාල්වරු 02 දෙනෙකු විසින් වැඩිපුර භාවිතාකළ ඉන්ධන ලීටර 3756 ක් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකු, අධ්‍යක්ෂවරයෙකු (අලෙවි) සහ අංශ ප්‍රධානියෙකු විසින් වැඩිපුර භාවිතාකළ ඉන්ධන ලීටර 1268 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාගෙන නොතිබුණි. | 695,873 | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| **(iv) 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී 03/2018 දරන චක්‍රලේඛය**<br>ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අදාළ රාජ්‍ය සංස්ථාවල වාර්ෂික ගිණුම් සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව සංස්ථාව ප්‍රමාද වී ගිණුම් ඉදිරිපත් කිරීම සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි සේවකයන් ප්‍රසාද දීමනාවලට හිමිකම් නොලැබුවද සමාලෝචිත වර්ෂය තුළදී එක් අයෙකුට රු.45,000 බැගින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. | 40,988,411 | පිළිතුරු සපයා නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------------------- | | | |
| **(i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය**<br>සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් සංස්ථාව සතු වාහන 47 හිම | - | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එලෙස ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | | |
| **(ii) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛය**<br>**2 ඡේදය**<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සංස්ථා සේවකයන්ට දිනකට පැය 08 කට වඩා අඩු කාලයක් සඳහා සහ මසකට දින 05 කට වැඩියෙන් අතිකාල දීමනා ලබාගත නොහැකි මුත් එයට පටහැනිව එම දීමනා ගෙවා තිබුණු බව 2018 මැයි මාසයට අදාළව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. මීට අමතරව සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛයක ප්‍රතිපාදන පදනම් කර ගනිමින් ඉහත සඳහන් සේවයේ යෙදීම් වෙනුවෙන් 2018 මැයි මාසයේදී සංස්ථාවේ 900ක් පමණ වූ සේවක සංඛ්‍යාවෙන් 350 දෙනෙකුට අධික සංඛ්‍යාවක් දින 05 ක් හෝ ඊට වැඩි දින සංඛ්‍යාවක්ද සමහර නිලධාරීන් දින 10 ක්, 11 ක් සහ 12 ක්ද නිවාඩු දින රාජකාරී කර ඒ සඳහා සති අන්ත විවේක දින දීමනාවක් හා අතිකාල දීමනාව යන දීමනා දෙකම එක් රාජකාරියක් සඳහා එකවර ලබාගෙන තිබුණි. | - පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඊ) 1998 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් පනත**<br>2017/2018 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු විධායක ශ්‍රේණියේ නිලධාරීන් 82 දෙනෙකුගෙන් 11 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. | - පිළිතුරු සපයා නොමැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් පවත්වා ගෙන යනු ලබන එක් බැංකු ගිණුමකට බැංකුව විසින් රු.179,000,000 උපරිම බැංකු අයිරා සීමාවක් ලබා දී තිබුණද වර්ෂයේ සෑම මාසයකදීම එම අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ අයිරා ශේෂය රු.275,474,993 ක් විය. එසේම පවත්වාගෙන යනු ලබන අනෙක් බැංකු ගිණුමේ බැංකු අයිරා සීමාව රු.10,000,000 ක් වුවත් සමාලොචිත වර්ෂයේ මාස 05 ක දීම එම අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු අයිරාව රු.8,825,452 ක් වී තිබුණි. අනුමත අයිරාව ඉක්මවන අයිරා ශේෂය සඳහා බැංකුව විසින් අමතර පොලියක් අය කරන අතර සමාලෝචිත වර්ෂයේදී මෙම බැංකු අයිරාවන් සඳහා අයිරා පොලී වශයෙන් රු.30,811,157 ක් ගෙවා තිබුණි. | මෙහි සඳහන් කර ඇති පරිදි 2018/12/31 දිනට ලංකා බැංකු ආයතනික ශාඛා ගිණුමේ අයිරා ශේෂය රු.275,474,993 ක් ලෙස දක්වා තිබුණද එය රු.235,474,993 ක් ලෙස නිවැරදි විය යුතුය.<br>එමෙන්ම එය මුදල් පොතට අනුව ශේෂය වන අතර බැංකු ගිණුමට අනුව අයිරාව රු. 205,605,573.50 ක් වේ.<br>එමෙන්ම මෙහි දක්වා ඇති ශේෂය රු.8,825,452 ක් වූ ලංකා බැංකු ටොරින්ටන් ශාඛාවේ මුදල් පොතට අනුව ශේෂය වේ. එහි බැංකු ගිණුමට අනුව වාසිදායක ශේෂය රු.2.850,826.15 වේ. | බැංකු අයිරාව අදාළ සීමාවන් ඉක්මවා නොයන ලෙස පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.188,800,669 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.193,927,831 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.382,728,500 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයෙන් ලද රු.479,000,000 ක් වූ ප්‍රදානය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2017 වර්ෂයේ පැවති අලාභය 2018 වර්ෂය වන විට එය ක්‍රමයෙන් අඩු වී ලාභයක් බවට පරිවර්තනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසු සංස්ථාවේ දායකත්වය 2017 වර්ෂයේදී රු.1,094,480,917 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,325,002,743 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| අනුපාතය | 2018 | 2017 | 2016 |
|---|---|---|---|
| දළ ලාභ අනුපාතය (සියයට) | 13 | 17 | 17 |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 11 | (10.9) | (13.6) |
| ජංගම අනුපාතය (වාර) | 2 | 1.67 | 1.98 |
| ක්ෂණික අනුපාතය (වාර) | 1 | 1.40 | 1.62 |

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ දළ ලාභ අනුපාතය අඩු වී තිබුණු නමුත් ශුද්ධ ලාභ අනුපාතය වර්ධනය වී තිබුණි. ජංගම අනුපාතයද ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ලොවට ගෙනයාම හා විදේශගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ඉතාලියේ හෝ යුරෝපයේ වෙනත් රටක ස්ථාපිත කරන මැදිරියක රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ තාවකාලිකව බදු පදනමක් යටතේ මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත ලබා ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් මාසයේදී අනුමැතිය ලබා දී තිබුණි. මෙහි ආරම්භක කටයුතු සඳහා අත්තිකාරම් වශයෙන් 2015 ජනවාරි 02 දින රු.3,454,279 ක් පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි චන්ද්‍රිකා තාක්ෂණය අන්තර්ජාතිකව බෙදාහරින සමාගමක් වෙත ලිඛිත ගිවිසුමක් හෝ මුදල් අමාත්‍යාංශ එකඟතාවයෙන් තොරව ගෙවා තිබුණි. එසේ වුවත් 2015 ජනවාරි මාසයෙන් පසුව මෙම කාර්යය මුළුමනින්ම අත්හැර දමා තිබුණු අතර ගෙවන ලද අත්තිකාරම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | චන්ද්‍රිකා තාක්‍ෂණය ඔස්සේ යුරෝපයේ වෙනත් රටක සිට රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යෑම පිණිස අත්තිකාරම් වශයෙන් 2015 ජනවාරි 02 දින රු.3,454,279 ක් ගෙවීම සම්බන්ධව අදාළ ආයතනයට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. එම නඩුව දැනට විභාග වෙමින් පවතී. | නෛතික කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථා සේවකයන් වෙත 1996 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළදී පුස්තකාලය විසින් ආපසු ලබාදීමේ පදනම මත නිකුත් කරන ලද රු.3,382,650 ක් වටිනා කැසට්පටි 1,562 ක් මෙම වාර්තාවේ දිනය දක්වා ආපසු භාර දී නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ආපසු ලබාදීමේ පදනම මත නිකුත් කරනු ලබන කැසට්පටි ආපසු ලබාගැනීම සඳහා විධිමත් පියවර අනුගමනය කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂය තුළදී වැඩසටහන් සඳහා ක්‍රමක්ෂය කරන ලද වටිනාකම වූ රු.69,854,416 තුළ සංස්ථාව විසින් බාහිරින් මිලදී ගත්, ගිවිසුම්ගත කාලය තුළදී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ වැඩසටහන් වෙනුවෙන් ක්‍රමක්ෂය කරන ලද රු.32,633,373 ක් ඇතුළත් වී තිබුණි. බාහිරින් මිලදීගත් වැඩසටහන් ගිවිසුම් කාලය තුළදී නියමිත වාර ගණනක් විකාශය කිරීමට ප්‍රමාණවත් විධිවිධාන යොදා නොතිබීම නිසා එම වැඩසටහන්වලින් කිසිදු ආදායමක් උපයාගැනීමකින් තොරව මෙසේ ක්‍රමක්ෂය කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | බාහිරින් මිලදී ගන්නා වැඩසටහන් ගිවිසුම් කාලය තුළදී නියමිත වාර ගණන විකාශය කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) 2016 අගෝස්තු මාසයේදී පැවති රියෝ ඔලිම්පික් තරගාවලියේ විකාශන අයිතිය ලබාගැනීම සම්බන්ධයෙන් ස්ටාර් ඉන්දියා පෞද්ගලික සමාගම හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර එළඹෙන ලද ගිවිසුම අනුව 2016 අගෝස්තු මාසයේදී ස්ටාර් ඉන්දියා පෞද්ගලික සමාගමට | පිළිතුරු සපයා නොමැත. | කිසියම් නිලධාරියෙකුගේ ප්‍රමාදය මත මෙම විනිමය අලාභය සිදු වී ඇත්නම් ඔහුගෙන් අයකර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතු එ.ජ.ඩො 125,000 ක් වසර දෙකකට වැඩි කාලයක් ප්‍රමාදවී ගෙවීම හේතුවෙන් විනිමය අනුපාතයේ වෙනස්කම් බලපෑමෙන් සංස්ථාවට රු.2,122,920 ක පමණ අවාසියක් සිදු වී තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ස්ථාපනය කරන ලද 1982 වර්ෂයේ සිට වසර 35 ක් පමණ එහි ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි අක්කර 8 ක් පමණ විශාල වූ ඉතා ඉහළ වටිනාකමකින් යුත් ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නෛතික අයිතිය සංස්ථාවට ලබා ගෙන එම දේපළවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | දේපළ අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිදුකරනු ලබන ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීමේ ඒකාධිකාරී බලය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හිමිව තිබුණද අදාළ රාජ්‍ය ආයතන දෙක විසින් මෙම ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීම සඳහා පෞද්ගලික නියෝජිතයන්/අතරමැදියන් මගින් ගුවන් කාලය වෙන්කර ගැනීම සිදු කරනු ලබයි. ඒ සඳහා සංස්ථාවට ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ආදායමෙන් සියයට 15ක කොමිස් මුදලක් අතරමැදි පාර්ශවයකට ගෙවීමට සිදුවන අතර ඊට අමතරව සංස්ථාවේ අලෙවි විධායකයින්ටද කොමිස් ගෙවීමට සිදුව තිබුණි.<br>සමාලෝචිත වර්ෂය තුළදී ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීමෙන් සංස්ථාව උපයා තිබුණු ආදායම | ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සංස්ථාවේ සේවා දායකයින් දෙදෙනෙක් වන අතර ඔවුන් නියෝජිත ආයතනයක් මගින් ගුවන් කාලය වෙන්කර ගැනීම සිදු කරනු ලබයි.ලොතරැයි දිනුම් ඇදීමේ ඒකාධිකාරී බලය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හිමිව තිබුණද එම සේවා දායක වටිනාකම සෘජුව සැපයීම හෝ නියෝජිකයෙකු මගින් සැපයීමේ අයිතිය ඇත්තේ අදාළ ආයතනයන්ට වේ. ඒඅනුව ලොතරැයි මණ්ඩල දෙකම නියෝජිත ආයතන මඟින් තම ගුවන්කාල වටිනා කම ලබා දෙන අතර අනෙකුත් ආයතනවලට මෙන්ම මෙම ආයතන දෙකද නියෝජිත | රජයේ ආයතන සමග කටයුතු කිරීමේදී අතරමැදියෙකු ලෙස නියෝජිතයෙකු යොදවා නොගෙන සෘජුවම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.763,356,152 ක් වූ අතර ඒ සඳහා වූ සංස්ථාවේ නිෂ්පාදන පිරිවැය රු.154,010,000 ක්, නියෝජිත කොමිස් රු. 91,401,923 ක් හා අලෙවි විධායක කොමිස් රු.1,078,703 වශයෙන් වියදම රු. 246,490,626 ක් වී තිබුණි. මෙම ගණුදෙනුව සඳහා රාජ්‍ය ආයතන සෘජුවම සම්බන්ධ නොවීම හේතුවෙන් රු.91,401,923 ක් සංස්ථාවට අහිමි වී තිබුණි. | ආයතන මඟින් පැමිණෙන්නේනම් සියයට 15කොමිස් මුදලක් ගෙවීමට සිදුවේ. | |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංහිඳියාවේ නාලිකාව වෙනුවෙන් ප්‍රධාන පාලක මැදිරියට රු.48,600,844 ක් වැයකර විදේශීය සැපයුම්කරුවෙකුගෙන් සන්නිවේදන උපකරණ මිලදීගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී සංස්ථාවේ තාක්ෂණික පිරිවිතර අනුව උපකරණ කොටස් සඳහා වගකීම් කාලය වසර 5ක් ලෙස දක්වා තිබුණද, සැපයුම් ගිවිසුමෙහි වගකීම් කාලය එක් වසරක් පමණක් වී තිබුණි. | සංහිඳියාවේ නාලිකාව සඳහා ප්‍රධාන පාලක මැදිරිය වෙනුවෙන් වැය කර තිබූ රුපියල් 48,600,844/-ක් වටිනා සන්නිවේදන උපකරණ මිළදී ගැනීමේදී ඒ තුළ එම උපකරණවලට අදාළ කේබල් කනෙක්ටර්ස්, මොනිටර්ස් වැනි උපාංග ඇතුළත් වේ. එවැනි උපාංග සඳහා නිෂ්පාදන සමාගම විසින් බලය පවරන ලද ලංසු ලේඛන ඉදිරිපත් කිරීමක් සිදු නොවේ. ප්‍රධාන උපකරණ සඳහා පමණක් බලය පවරන ලද ලංසු ලේඛන ඉදිරිපත් කරනු ලැබේ.<br>සංස්ථාවේ තාක්‍ෂණ පිරිවිතර අනුව උපකරන කොටස් සඳහා වගකීම් කාලය වසර 05ක් ලෙස දක්වා ඇති අතර ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් ලිපි ලේඛනවලට අනුව එවැනි අදාළ උපකරණවලට වසර 05ක වගකීම් කාලයක් ලබාදෙන බවක් සඳහන් කර ඇත.එහෙත් සැපයුම් ගිවිසුමෙහි පොදු කරුණක් යටතේ වගකීම් කාලය වසරක් පමණක් දක්වා ඇත. | ගිවිසුම්වලට එළඹීමේදී ඇතුළත් කළ යුතු කොන්දේසි පිළිබඳව නිසි අවධානය යොමුකළ යුතුය.<br>සංස්ථාවේ තාක්ෂණික පිරිවිතර පරිදි සැපයුම් ගිවිසුම සංශෝධනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) තවද සතියේ ඕනෑම දිනක පැය 24 තුළම සේවා සහාය ලබා දීමට සැපයුම්කාර සමාගම එකග වී තිබුණද, 64 x 64 Digital Video Switch මිලදී ගෙන මාස 09 ක් ඉකුත්වීමට පෙර ක්‍රියාවිරහිත වී තිබුණු අතර ඒ සඳහා සේවා සැපයීම දින 21 කට පසුව ආරම්භකර තිබුණි. තවද, මෙම උපකරණය සඳහා අතිරේක පද්ධතියක් සැපයීමට සහ ඇතැම් උපකරණ සඳහා අවශ්‍ය අමතර උපාංග සැපයීමට පිරිවිතර අනුව එකග වී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ගිවිසුම් කඩවීම් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.6.1 අනුව එකම භාණ්ඩය මිලදී ගැනීම සඳහා මුල් සැපයුම්කරු වෙත නැවත ඇනවුමක් නිකුත් කරනු ලබන විට එම ඇනවුමේ වටිනාකම මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් නොඉක්මවිය යුතු වේ. එසේ වුවද,2018 ජනවාරි සහ පෙබරවාරි මාස තුලදී broadcast quality H.D කැමරා තුනක් එ.ජ.ඩො 82,256.12 කට මිලදී ගත් කොන්ත්‍රාත්කරුගෙන් මාර්තු සහ අප්‍රේල් මස තුළදී නැවත කැමරා දෙකක් එ.ජ.ඩො 47,685.52 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්තුවේ සියයට 50 ක වටිනාකමට වඩා එ.ජ.ඩො 6,557.46 ක් ඉක්මවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව උපරිම වාසි සැලසෙන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ඈ) සංස්ථාව විසින් සංවිධානය කරන විවිධ රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් උපකරණ පහසුකම් කුළියට ලබා ගැනීමේදී රාජගිරිය ප්‍රදේශයේ සැපයුම්කාර සමාගමක් වෙතින් වැඩසටහන් 2ට අදාළව අවස්ථා 4 කදී රු. 1,845,900 ක් වැයකර වේදිකා, විදුලි ආලෝකකරණය සහ දෘශ්‍ය පථ වැනි පහසුකම් කුළියට ලබා ගැනීම සිදු කර තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් ඇතැම් අවම මිල ගණන් සහිත ලංසු ප්‍රමාද වී ලැබීම නිසා ප්‍රතික්ෂේප වී තිබුණද තවත් | පිළිතුරු සපයා නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව උපරිම වාසි සැලසෙන අයුරින් කටයුතු කළ යුතුය. |

අවස්ථාවකදී අවම මිල ගණන් සපයන ලද ලංසුකරුවන් දෙදෙනෙකුගේ ලංසු ප්‍රතික්ෂේප කොට වැඩිම මිලක් සහිත ප්‍රමාද වී ලැබුණ ලංසුව සැපයුම්කාර පාර්ශවය ලෙස තෝරා ගැනීමට කටයුතු කර තිබුණි.

ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කරමින් වඩාත් යෝග්‍ය සැපයුම්කරු තෝරා ගැනීමට තිබූ අවස්ථා මගහරිමින් එක් සැපයුම්කාර පාර්ශවයකට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමට ක්‍රියා කර තිබූ බවට වැඩි දුරටත් නිරීක්ෂණය විය. තවද ලංසු මුද්‍රා තබා එවන ලෙස ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් වුවද ෆැක්ස් පණිවිඩ මගින් ද ලංසු ලබාගැනීමට කටයුතු කර තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | සංස්ථාවට අනුමත කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව ස්ථිර 1,041 ක් සහ කොන්ත්‍රාත් 08 ක් ලෙස එකතුව 1,049 ක් විය. නමුත් එදිනට සේවයේ නියුක්ත ස්ථිර තනතුරු සංඛ්‍යාව 864 ක් පමණක් වූ අතර එදිනට අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටින නිලධාරීන් සංඛ්‍යාව 110 ක් විය. ඒ අනුව එදිනට ස්ථිර විවිධ තනතුරුවල ඇබෑර්තු 75 ක් පැවතුණි. එසේම වැඩබලන තනතුරු 06 ක් ද ලබා දී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා පමණක් බඳවා ගැනීම් කළ යුතුය. |
| (ii) | සංස්ථාවට කාර්ය මණ්ඩලය අනුමත කරන ලද අංක DMS/E4/37/4/231/1-1 හා 2011 ජූනි 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු තනතුරු නාම 11 ක් සඳහා සේවකයන් 16 දෙනෙකු කොන්ත්‍රාත් සහ සේවකයන් 22 ක් කාර්ය පැවරුම් පදනම යටතේ බඳවාගෙන තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා පමණක් බඳවා ගැනීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) ඉහත සඳහන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් 2011 ජූනි 30 දිනට තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවත්වාගෙන යා යුතු තනතුරු නාම කිහිපයක් අනුමත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එලෙස නිලධාරියාට පෞද්ගලික වන සේ පවත්වාගෙන යනු ලබන තනතුරුවල නිලධාරීන් 301 ක් සිටිය අතර එම තනතුරු සංඛ්‍යාව තුළ වැඩ බලන නිලධාරීන් 03 දෙනෙකු සිටිය බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | අනුමත විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iv) සංස්ථාවේ විධායක තනතුරුවලට වැඩබැලීමේ පත්කිරීම් සිදු කිරීමේදී සංස්ථාවේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ සහ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 1.7 වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් සපුරා නොමැති නිලධාරීන් පත් කර තිබුණු අවස්ථා 06 ක් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | අනුමත බඳවාගැනීමේ පටිපාටිය හා අනෙකුත් අදාළ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 - 2019 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. සංයුක්ත සැලැස්මේ මූල්‍ය පුරෝකථනය අනුව 2018 වර්ෂය අවසාන වන විට ගුවන් කාල විකුණුම් ආදායම රු.මිලියන 2,350 ක්ද බදු පෙර ලාභය රු. මිලියන 60 ක්ද ලබා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් එදිනට ලබා තිබුණු ගුවන් කාල විකුණුම් ආදායම රු. මිලියන 1,698 ක් වූ අතර සංයුක්ත සැලැස්මට ඇතුළත්ව නොතිබූ රු.මිලියන. 479 ක රජයේ ප්‍රදාන හේතුවෙන් රු. මිලියන 190 ක සත්‍ය බදු පෙර ලාභයක් උපයා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ලබා කරගත හැකි තත්වයන් පිළිබඳව නිසි අධ්‍යයනයකින් පසුව සැලසුම් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම මගින් යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා පුළුල් කිරීම් සහ අනෙකුත් ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් කරමින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ඇ) සංස්ථාව විසින් ව්‍යාපාරික පරිසරයේ ඇති ශක්තීන් (Strengths), දුර්වලතාවයන් (Weaknesses), අවස්ථාවන් (Opportunities) සහ බාධක (Threats) පිළිබඳව ඇගයීමක් කර තිබුණි. එසේම එහි ඇතුළත් දුර්වලතාවයන් (Weaknesses) අවම කර ගැනීම සඳහා කළ යුතු කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනාගෙන තිබුණි. එසේ වුවත් සංස්ථාවේ පැවති අයහපත් මූල්‍ය තත්වය හේතුවෙන් එම බාධක අවම කර ගැනීම සඳහා සැළසුම් කරන ලද කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත තනතුරු දෙක සමඟ කළමනාකාර සහකාර තනතුරු දරන 04 දෙනෙකුද, සමඟ කාර්ය මණ්ඩලය 06 දෙනෙකු රාජකාරි කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් නිකුත් කර නොතිබුණු අතර සභාපති වෙත විගණන වාර්තා 11 ක් පමණක් නිකුත් කර තිබුණි එසේ වුවද එම වාර්තාවලින් පෙන්වා දුන් වැරදි හා අඩුපාඩු බොහොමයක් නිවැරැදි කිරීමට සහ කරන ලද වැදගත් යෝජනා ක්‍රියාත්මක කිරීමට පාලනාධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු අතර ඒ තුළින් හඳුනාගන්නා අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2011 ජුනි 30 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංස්ථාවට අනුමත කරන ලද කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන නිලධාරි වශයෙන් තනතුරු දෙකක් පමණක් සංස්ථාවට අනුමත කර තිබුණි. ඉන් ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2018 ඔක්තෝබර් 01 දින සිට පුරප්පාඩුව පවතින අතර එම තනතුර පිරවීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්හි ප්‍රතිඵලයේ අයවැයගත සහ තථ්‍ය මූල්‍යමය දත්තයන්හී අවාසි සහගත විචලනයන් දක්නට ලැබෙන බැවින් අයවැයමය පාලනය සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා සාර්ථක පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට සංස්ථාවේ කළමනාකරණය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රායෝගික තත්ත්වයන් නිවැරදිව ඇස්තමේන්තු කර අයවැය පිළියෙල කළ යුතුය. |